**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**

# තනතුරු පුරප්පාඩු

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ **සංවර්ධන නිළධාරි** තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව දැනට රජයේ සේවයේ නියුතු නිලධාරියකු / අයදුම්කරුවකු වේ නම්, ඔහු හෝ ඇය ස්වකීය අමාත්‍යාංශයේ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත යොමුකළ යුතු අතර ඔහු හෝ ඇය බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලදහොත් සේවා ස්ථානයෙන් මුදා හැරිය හැකි බවට සහතිකයක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

අයදුම්කරුවන් ස්වකීය සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු ඇතුළත්ව තමන් විසින් සකස් කරගන්නා ලද ජීව දත්ත පත්‍රිකාවක්, අදාළ අධ්‍යාපන සහ පළපුරුද්ද සහතික කරන ලද සහතික පත්‍රවල පිටපත් සමඟ, **"සභාපති, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, 11 වන මහල 'ඒ', සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල"** යන ලිපිනයට 2021/06/28 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (විෂය තීරුවෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර) එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම / නොගැනීම සම්බන්ධව සියලුම බලතල දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය සතුය.

| සංවර්ධන නිළධාරී (MA 3) -තනතුරු 01 | |
|---|---|
| අධ්‍යාපන හා වෘත්තීමය සුදුසුකම් | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මූලික උපාධියක් ලබා තිබීම (වෙබ් නිර්මාණකරණය, වීඩියෝ හා ඩිජිටල් පෝස්ටර් නිර්මාණකරණ හැකියාව අමතර සුදුසුකමකි) |
| වයස් සීමාව | 2021/06/28 දිනට අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| වැටුප් පරිමාණය | රු (32200 – 10x445 -11x660- 10x730-05x750- 54,960)<br>(වැටුප් ගෙවීමේදී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි සඳහන් විධිවිධාන අදාළ වේ.) |
| රැකියාවේ ස්වභාවය | ස්ථිර හා අර්ථසාධක සහිත |


**සභාපති**
**දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය**
**11 වන මහල "ඒ"සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල**
**දු.අ : 0112187140 / ෆැක්ස් : 0112186024**
**විද්‍යුත් තැපැල : natamoh.lk@gmail.com**
**වෙබ්: www.nata.gov.lk**